# (උ) ගෙවුම් ශේෂය, විදේශීය වත්කම් සහ සංචාරක ව්‍යාපාරය

ලංකාවේ ගෙවුම් ශේෂය සහ විදේශීය වත්කම් පිළිබඳ විස්තරාත්මක සංඛ්‍යා ලේඛන දෙවන පරිශිෂ්ඨයෙහි එන 43 සිට 47 දක්වා වූ සංඛ්‍යා සටහන්වල ඇත. බොහෝ දුරට, වර්ෂයෙහි නියම ලැබීම් හා ගෙවීම් පිළිබඳ විනිමය පාලන වාර්තාවලින් උපුටා ගනු ලබන ගෙවුම් ශේෂ සංඛ්‍යා දත්තයන්, ක්‍රම සම්පාදන හා රැකීරක්ෂා අමාත්‍යාංශය වැනි සෙසු මූලයන්ගෙන් ද ලබා ගන්නා තොරතුරු ඇසුරෙන් සපුරා ගනු ලැබේ. මෙම සංඛ්‍යා, රේගු වාර්තා මත පදනම් වන විදේශීය වෙළඳ අංශයේ භාවිත කර ඇති සංඛ්‍යාවලින් වෙනස් විය හැක.

## (අ) පසුතලය හා ප්‍රවණතා

මෑත වසර වලදී, ජංගම ගිණුමෙහි විශාල එමෙන්ම නිරන්තර හිඟයනට තුඩුදුන් සාධක 1970 දී ද එලෙසම ක්‍රියාත්මකවීම සිදුවිය. ආනයන මිල දර්ශකය 1967=100) 1969 දී 134 ක් වූ අතර, 1970 දී 140 දක්වා තවදුරටත් ඉහළ නැගුණි. අපනයන මිල පිළිබඳ සුළු දියුණුවක්, 1969 දී 117 ලෙස පැවති දර්ශකය 1970 දී 118 දක්වා ඉහළ යාමෙන් පෙනී ගියත්, එය තව දුරටත් වෙළඳ අනුපාතයේ සිදුවෙමින් තිබූ පිරිහීම වලක්වාලීමට තරම් ප්‍රමාණවත් නොවීය; වෙළඳ අනුපාත දර්ශකය ඉහත වසරේ පැවැති 88 සිට 84 දක්වා පහත බැස්සේය.

වෙළඳ අනුපාතය පිරිහීම අඛණ්ඩව පැවතුණ අතර, අපනයනය කළ ප්‍රමාණයන්හි කිසියම් දියුණුවක් දක්නට ලැබිණ. අපනයන පරිමාව පිළිබඳ දර්ශකය (1967=100) 98 සිට 102 දක්වා ඉහළ ගියේය. මෙම ඉහළයාම, සුළු වශයෙන් වැඩිවූ මිල මට්ටම් සමග එක් වෙමින්, 1970 දී අපනයන ලැබීම් රුපියල් දශ ලක්ෂ 102 කින් ප්‍රසාරණය කිරීමට හෙවත් රුපියල් දශ ලක්ෂ 2011 තෙක් ඉහළ නැංවීමට ඉවහල්විය. රුපියල් වටිනාකම් අනුව මෙම අපනයන ලැබීම්, 1967 නොවැම්බරයෙහි ලංකා රුපියල අවප්‍රමාණ කළ පසු වාර්තා කෙරුණ ඉහළම මට්ටම විය. ආනයන ප්‍රමාණය සම්බන්ධයෙන් ද කැපී පෙනෙන අඩුවීමක් දක්නට ලැබුණ බව, 1969 දී 108 ක් වූ එම දර්ශකය 1970 දී 102 දක්වා පහළ යාමෙන් කිව හැක. මෙහි ප්‍රතිඵලයක් ලෙස, (ශුද්ධ නිල සංක්‍රාම රහිතව) ජංගම ගිණුමේ හිඟය 1969 දී හටගත් රුපියල් දශ ලක්ෂ 843 ක වාර්තා ගත මට්ටමේ සිට, රුපියල් දශ ලක්ෂ 468 දක්වා සංකෝචනය වීමක් 1970 දී සිදු විය.

ජංගම ගිණුමේ හිඟයෙහි සැලෙහන පමණ අඩුවීමක් පෙනීගිය නමුදු, විදේශීය මුදල් තත්ත්වය ගැලපීම සම්බන්ධයෙන් ඉමහත් ප්‍රශ්න ඉස්මතු විය. ඉහත කාලයන්හිදී දරන්නට සිදු වූ අඛණ්ඩ හිඟයන්හි සමුච්චිත ප්‍රතිවිපාකයක් ලෙස, ලංකාවේ විදේශ සංචිත පිරිහී ගියේය. දැනට පවත්නා මට්ටම අනුව, විදේශීය ලැබීම් හා ගෙවීම් පිළිබඳව, හදිසි හා අනපේක්ෂිත විශාල වෙනසකට මුහුණ දීමට තරම් එම සංචිත ප්‍රමාණවත් නොවේ. ඒ නිසා 1970 දී මූල්‍ය අධිකාරීන්ගේ විමසිල්ල දැන වූ ප්‍රධාන කරුණක් වූයේ විදේශීය සංචිතයන්හි පහත් මට්ටමය.

ගෙවුම් ශේෂ හිඟයයන් පියවීමේදී, කෙටි කාලීන ණය මත වඩ වඩාත් රඳා පැවතීම කුතුහලයට තුඩු දුන් තවත් කරුණකි. මහ බැංකුව විසින් මීට පෙර විදේශ බැංකු හා මූල්‍ය ආයතන සමග කතිකා කොට ණය ක්‍රම කීපයක් පිළියෙල කොට තිබුණි. ඒ, රටේ ගෙවුම් තත්ත්වය පිළිබඳ කිසියම් හදිසි අයහපත් තත්ත්වයක් මතු වුවහොත් ඊට ද්‍රවශීල වත්කම් සැපයීම පහසුවන පරිදිය. හදිසියකදී යොදා ගැන්මේ බලාපොරොත්තුවෙන් පිළියෙල කෙරුනද, මේ අන්දමේ ණයවලින් සැලකිය යුතු තරම් ප්‍රයෝජන ගැනීමට සිදු වූයේ, විදේශ ලැබීම් හා ගෙවීම්වල නිතර හටගත් පරතරයන් පියවීමටය. මෙසේ දිගින් දිගට සිදුවන හිඟයයන් පියවීමට ඉහත කී ලෙස කෙටි කාලීන මුදල් යොදා ගැනීම ලංකාවේ ආර්ථිකයට අනතුරු හඟවයි. මෙබඳු ණය ලබාගත හැකිවීම රඳා පවත්නේ, ලංකාවට ණය දීමට ඇති විශ්වාසදායී තත්ත්වය තවදුරටත් පැවතීම මතත්, ලෝක මුදල් වෙළඳපොළේ පවත්නා වූ, ලංකාවේ පාලනයෙන් බැහැර වූ කොන්දේසි මතත්ය. විදේශවල දැඩි මුදල් ප්‍රතිපත්ති පවත්නා අවධියක

මෙබඳු ණය ඉවත් කිරීමට හෝ යළිත් අලුත් නොකිරීමට ඉඩ ඇත; එවැන්නක් විදේශීය භාණ්ඩ හා සේවාවලට කරන වියදම ක්ෂණිකව හා සැහෙන පමණ කපා හැරීමට බල කරන තත්ත්වයක් ලංකාවට උද්ගත කරනු ඇත. වියදම පිළිබඳව එවැනි කපා හැරීමකට කිසියම් හැකියාවක් පෙනීගියද, එවැනි කපා හැරීමක් කිරීමට ගත වන කාලය තුළ, මහ බැංකුවට දැනට තමන් සතු විදේශ සංචිත මට්ටම අනුව ප්‍රශ්ණ උද්ගත වනු ඇත.

1963 පමණ සිටම, මුදල් නීති සංග්‍රහයේ 68 වන වගන්තිය යටතේ, රජයට ඉදිරිපත් කරන ලද වාර්තා ගණනාවකම විෂයය වූයේ සීඝ්‍රයෙන් පිරිහෙන විදේශීය විනිමය තත්ත්වයයි. 1970 දී, මුදල් මණ්ඩලය අතිරේක වාර්තාද ඉදිරිපත් කිරීමට පටන් ගත් අතර, ඒවායින්, මහ බැංකුවේ ජාත්‍යන්තර සංචිතයේ ද්‍රවශීල තත්ත්වය ගැනත්, ද්‍රවශීල වත්කම් සැපයුම වැඩි කිරීමට ඉක්මණින් පියවර ගතයුතු බවත්, විශේෂ අවධාරණයකින් යුතුව දක්වන ලදී.

නව රජය 1970 මැයි මාසයේදී බලයට පත් විට, එය වහාම ගත් පියවරක් වූයේ විදේශ විනිමය තත්ත්වය සමාලෝචනය කරන තුරු විවෘත පොදු බලපත්‍ර ක්‍රමය අත් හිටුවීමය. ලංකාවේ ගෙවුම් ශේෂයේ, නුදුරු අනාගතයේදී සැහෙන දියුණුවක් බලාපොරොත්තු විය නොහැකි බව පෙනී යාමේදී, විවෘත පොදු බලපත්‍ර ක්‍රමය අත්හිටුවීම හැර අන් කළ හැකි දෙයක් නැති තරම් විය. ඒ අනුව, සියලුම ආනයන, පෞද්ගලික ආනයන බලපත්‍ර යටතට ගෙන ඒම හා ප්‍රමුඛත්ව ක්‍රමයක් යටතේ පංගු නිකුත් කිරීමට තීරණය කෙරුණි.

කෙසේ වෙතත්, සේවා ගිණුමෙහි පොලී ගෙවීම් සීඝ්‍රලෙස ඉහළ නැගීම, 1970 දී හිඟය තියුණු කිරීමට තුඩු දුනි. එහෙත් සඳහන් කළයුතු විශේෂ කරුණක් වන්නේ, සංචාරක ඉපයීම් 1969 පැවති රුපියල් දශ ලක්ෂ 17 සිට, 1970 දී රුපියල් දශ ලක්ෂ 22 තෙක්, සියයට 30 කින් පමණ ඉහළ යාමක් සිදුවීමය. මෙය, පළමු වතාවට විදේශ සංචාර ගිණුමෙහි අතිරික්තයක් හටගත් වර්ෂය වෙයි.

1970 දී, විදේශීය සම්පත් පරතරයෙහි, සුලු අඩුවීමක් සිදුවූයේ මුළුමනින්ම වෙළඳ ගිණුමෙහි ඇතිවූ වර්ධනය නිසාය. කෙසේ වෙතත්, මේ වර්ධනය අනාගතය පිළිබඳ සුබවාදී බවකට හේතු නොවේ; අපනයන ලැබීම්වල කැපී පෙනෙන ඉහළ යාමක් සිදු වුවත්, එම ඉහළ යාමේ ප්‍රමාණය ලංකාවේ ජංගම ගෙවීම් හා ලැබීම් අතර පවතින පරතරය හා සසඳන කල ප්‍රමාණවත් එකක් නොවන බැවිනි. එක්තරා දිරි ගන්වන සුලු ලක්ෂණයක් වනුයේ, සුලු අපනයන ද්‍රව්‍යයන්ගෙන් ලද ඉපයීම්, රේගු වාර්තා අනුව 1969 දී, රුපියල් දශ ලක්ෂ 161.2 සිට 1970 දී, රුපියල් දශ ලක්ෂ 198.5 දක්වා එනම්, සියයට 23 කින් ඉහළ යාමය. විදේශ විනිමය හිමිකම් සහතික පත්‍ර ක්‍රමයෙන් දෙන ලද අනුබලය යටතේ මෙම අපනයන වල වර්ධනයක් තවදුරටත් අපේක්ෂා කළ හැක.

දේශීය අර්ථ ක්‍රමයට හානියක් නොවන පරිදි, 1970 මට්ටමේම ආනයන පවත්වා ගැනීමට හැකිවේද යන්න සැක සහිත කරුණකි. එක් අතකින් ඉහළ යන ජනගහනය හමුවේ අවශ්‍යතා පිරිමැසීමට අතිරේක ආනයන ප්‍රමාණයක් අවශ්‍ය වීමත්, අනිත් අතට, සීඝ්‍ර සංවර්ධන වේගයක් පවත්වා ගැනීමට විවිධ ආයෝජන සැලසුම් සඳහා අතිරේක ආනයන තොගයක් වුවමනා වීමත් පෙනී යන බැවිනි.

ආනයන පිළිබඳව කෙරෙන කිසියම් සීමාවක්, අර්ථ ක්‍රමයේ වර්ධන වේගය හීන කිරීමට තුඩු දිය හැකි අතරම, මුදල් යෙදවීමට රටට ශක්තිය ඇති ආනයනවල ප්‍රමාණය වර්තමානයේ තිබෙන ප්‍රවණතා දිගටම පැවතුණහොත් සීඝ්‍රයෙන් පිරිහී යනු ඇතැයි ද පිළිගත යුතුව ඇත. ඉහළ නගින ණය සේවා හමුවේ, ආනයන සඳහා වෙන් කිරීමට ඉතිරි වන විදේශ විනිමය ප්‍රමාණය අඩුවනු ඇත. එමෙන්ම ආනයන මිල දිගටම ඉහළ නැගීම සිදු වුවහොත්, ඒ අනුව ආනයන ධාරිතාව හීනවනු ඇත.

මේ පරිසරය යටතේ, රටේ විදේශ මුදල් තත්ත්වය වඩාත් යහපත් අඩියකට ගෙන ඒමට ඉවහල් වන අන්දමේ ප්‍රතිපත්ති පියවර කීපයක් රජය විසින් ගෙන ඇත. නිල වශයෙන් කෙරුණ ප්‍රකාශ කීපයකදීම, ගෙවුම් ශේෂ තත්ත්වය පිළිබඳ පවත්නා බරපතල ස්වරූපයත්;

විදේශ විනිමය රැක ගැනීම පිළිබඳ අවශ්‍යතාවයත්, ගැන රජය මහජනයාට ඒත්තු ගැන්වීමට තැත් දරා ඇත. අයවැය ලේඛනය මගින් හඳුන්වා දෙන ලද ඇතැම් පියවර කීපයක් ද ආනයන ඉල්ලුම් පුළුල් වීම වැළැක්මට තුඩු දෙනු ඇත. ඒ අතර, වඩාත් වැදගත් වනුයේ;

(අ) අයවැය හිඟයෙහි බැංකු ණය මගින් මුදල් සම්පාදනය කෙරෙන කොටස අඩු කිරීම;

(ආ) රජයේ සුරැකුම් සහ ඉතුරුම් තැන්පතු සඳහා ලැබෙන පොළී ප්‍රමාණය ඉහළ නැංවීම;

(ඇ) නව අනිවාර්ය ඉතුරු කිරීමේ යෝජනා ක්‍රමය ඇරඹීම, සහ,

(ඈ) සේවක අර්ථසාධක අරමුදලට කරන දායක දීමනා වැඩි කිරීම.

රජය, රටේ කාර්මික ප්‍රතිපත්තිය සම්පාදනයේදී ද, ගෙවුම් ශේෂ ප්‍රශ්ණයත් පිළිබඳව අවධාරණයෙන් යුක්තව ක්‍රියා කිරීමට තැත් දරා ඇත. නිදසුනක් ලෙස, නව කාර්මික වැඩ පිළිවෙළවල් වලට නිල අනුමතිය දීමේදී, එක්කෝ ආනයන ඉතුරු කිරීමක් ලෙසින් (විශේෂයෙන්ම දේශීය අමු ද්‍රව්‍ය යොදා ගැනීම මගින්) හෝ නව අපනයන දියුණු කිරීමක් ලෙසින් වැදගත් මෙහෙයක් කළ හැකි කර්මාන්තවලට මුල් තැනක් දීම සිදු කෙරෙනු ඇත.

මෙකී පියවරවල සම්පූර්ණ බලපෑම දැනෙනු ඇත්තේ දීර්ඝකාලීනවය. එහෙත් යම් කිසි තරමක සමතුලිතතාවයක් ප්‍රතිෂ්ඨාපනය කෙරෙන තුරු, දිගින් දිගටම හට ගන්නා ගෙවුම් ශේෂ දුෂ්කරතා සම්බන්ධව කිසියම් ගැලපීමක් ඇතිකර ගැනීමට රටට සිදුවනු ඇත.

## (ආ) 1970 දී විදේශීය සම්පත් සහ ඒවා ප්‍රයෝජනයට ගැනීම

1970 දී, ලංකාවේ ගෙවුම් ශේෂය හැඩ ගැසුණු සැටි සහ 1969 හා සසඳන විට එහි තත්ත්වය පිළිබඳ විස්තර (අ) සංඛ්‍යා සටහනෙහි දැක්වේ. ඉහත වර්ෂ වලදී මෙන්ම ජංගම ගිණුම හිඟයකින් යුක්ත වෙතත්, 1969 පැවති රුපියල් දශ ලක්ෂ 843 ක විශාල හිඟය, මේ වර්ෂයේදී රුපියල් දශ ලක්ෂ 468 දක්වා සංකෝචනය වී ඇත.

### 1. වෙළඳ ගිණුම

විනිමය ගණුදෙනු පදනම මත වාර්තා කෙරුණ පරිදි, අපනයන ඉපයීම් වලට වටිනාකම 1969 ට වඩා රුපියල් දශ ලක්ෂ 102 කින් වැඩිවී, රුපියල් දශ ලක්ෂ 2011 බවට පත්ව ඇත. මෙය විදේශ විනිමය අය වැය සම්පාදනය සඳහා, මුලදී පුරෝකථනය කොට තිබූ රුපියල් දශ ලක්ෂ 2008 මට්ටමට බෙහෙවින්ම සමානය. අනික් අතට, (ආධාර වැඩ පිළිවෙළ යටතේ මුදල් සැපයුණ ආනයන ද (ඇතුළුව, ආනයන ගෙවීම් රුපියල් දශ ලක්ෂ 2336 ලෙස ඇස්තමේන්තු කෙරුණ අතර, එය 1969 ට වඩා රුපියල් දශ ලක්ෂ 319 කින් අඩු වී ඇත. ලංකාවේ ස්වසම්පත්වලින් මුදල් සැපයුණ ආනයනවල වටිනාකම රුපියල් දශ ලක්ෂ 1867 ක් විය. මෙසේ, අපනයන කටයුතුවල වූ සැහෙන දියුණුවත්, ආනයන ගැලීම් පිළිබඳව පාලනයක් කිරීමට රටට හැකි වීමත්, වෙළඳ ගිණුමේ හිඟය පහත හෙළීමට තුඩුදුන් ප්‍රධාන සාධක විය.

අපනයන ඉපයීම්වල වැඩිවීමෙන් කොටසක්, 1970 සිට, ප්‍රති-වර්ගීකරණය කරන ලද පරිදි නැව් තෙල් පිටරට විකිණීමෙන් ලැබෙන ආදයම්, අපනයන ඉපයීම් ලෙස සැලකීමට පටන් ගැනීම නිසා සිදුවූ බව කිව යුතුය. මීට පෙර එබඳු ඉපයීම් ඇතුළත් වූයේ සේවා ගිණුම තුළය. මෙම ප්‍රති-වර්ගීකරණය අවශ්‍ය බවට පත්වූයේ, නැව් තෙල් විකිණීම ලංකා ඛණිජ තෙල් සංස්ථාව යටතට පවරා ගැනීමේ ප්‍රතිඵලයක් ලෙසය.

ආධාර සහ සැපයුම් කරුවන්ගේ ණය තව තවත් ලබා ගැනීමට හැකිවීම හේතුවෙන්, ලංකාවට ස්වවිනිමය සම්පත් යොදා නොගෙන රුපියල් දශ ලක්ෂ 469 ක වටිනාකමකින් යුතු භාණ්ඩ ආනයනය කළ හැකි විය. 1969 සමග සසඳන කල, ආධාර සහ ණය මගින් මුදල් සැපයුණ ආනයනයන්හි වටිනාකම රුපියල් දශ ලක්ෂ 112 කින් පහළ බැස ඇත. ලංකාවේ ස්ව විනිමය සම්පත් මගින් කළ ආනයනයන්හි වටිනාකම ද රුපියල් දශ ලක්ෂ 207 කින් අඩුවීමක් දක්වයි.

II (ඇ) 1 වන සංඛ්‍යා සටහනෙහි 1969 හා 1970 වර්ෂයන්හිදී 'ඒ' සහ 'බී' පංගු ආනයන සඳහා නිකුත් කළ බලපත්‍ර පිළිබඳවත්, විවෘත පොදු බලපත්‍ර ආනයන (ඕ. ජී. එල්.) සඳහා විවර කළ ණයවර ලිපි පිළිබඳවත්, තොරතුරු සැපයෙයි. මෙම වර්ග යටතේ කළ ස්ව සම්පත්වලින් මුදල් සැපයුණ ආනයන පිළිබඳ තොරතුරු II (ඇ) 2 සංඛ්‍යා සටහනෙහි ඇතුළත්ය.

## II (ඇ) 1 වන සංඛ්‍යා සටහන

### පංගු ආනයන සඳහා නිකුත් කළ බලපත්‍රවල වටිනාකම* සහ විවෘත පොදු බලපත්‍ර යටතේ කළ ආනයන සඳහා විවර කළ ණයවර ලිපිවල වටිනාකම: 1969 සහ 1970.

රුපියල් දශ ලක්ෂ

| | වටිනාකම | | වෙනස |
|---|---|---|---|
| | 1969 | 1970 | |
| බලපත්‍ර | | | |
| 'ඒ' පංගුව .. .. | 1,203 | 1,101 | − 102 |
| 'බී' පංගුව .. .. | 605 | 785 | + 180 |
| එකතුව .. .. | 1,808 | 1,886 | + 78 |
| විවෘත පොදු බලපත්‍ර යටතේ කළ ආනයන සඳහා විවර කළ ණයවර ලිපි .. .. | 374 | 135 | − 239 |
| එකතුව | 2,182 | 2,021 | − 161 |

මූලය. ක්‍රම සම්පාදන හා රැකීරක්ෂා අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව.

* 'ස්වසම්පත්' පදනමක් මත කෙරුණ ආනයන ගැන පමණක් සඳහන් වේ.

## II (ඇ) 2 වැනි සංඛ්‍යා සටහන

### ස්ව සම්පත් පදනම මත කෙරුණ ආනයන (අ) — 1969 සහ 1970

රුපියල් දශ ලක්ෂ

| | 1969 | 1970 (ආ) |
|---|---|---|
| පංගු බලපත්‍ර යටතේ කළ ආනයන | | |
| 'ඒ' පංගුව .. .. | 1,237 | 1,002 |
| 'බී' පංගුව .. .. | 422 | 612 |
| එකතුව .. .. | 1,659 | 1,614 |
| විවෘත පොදු බලපත්‍ර යටතේ කළ ආනයන .. | 415 | 253 |
| එකතුව | 2,074 | 1,867 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) කෙටි කාලීන ණය මගින් මුදල් සැපයුන ආනයන ඇතුළත්ය.
(ආ) තාවකාලිකය.

විවෘත පොදු බලපත්‍ර ආනයන සඳහා විවර කළ ණයවර ලිපිවල වටිනාකම 1970 දී රුපියල් දශ ලක්ෂ 135 තෙක් දැඩිව පහළ බැසීමටත්, 'බී' පංගු ආනයන බලපත්‍රවල වටිනාකම රුපියල් දශ ලක්ෂ 605 සිට, රුපියල් දශ ලක්ෂ 785 දක්වා ඉහළ යාමටත් හේතු වූයේ, 1970 ජූනි මස සිට විවෘත පොදු බලපත්‍ර ක්‍රමය අත්හිටුවා, එය යටතේ තිබූ ඇතැම් භාණ්ඩ 'බී' පංගු ගණයට මාරු කිරීමය.

### 2. සේවා ගිණුම

1969 හා සසඳන විට වෙළඳ ගිණුමෙ දියුණුවක් ඇති වූවත්, සේවා ගිණුම තවදුරටත් පිරිහීමක් II (ඇ) 3 වෙනි සංඛ්‍යා සටහනෙන් පැහැදිලි වෙයි. පෙර වසරේ පැවති රුපියල් දශ ලක්ෂ 97 ක් වූ හිඟය, 1970 දී රුපියල් දශ ලක්ෂ 143 ක් බවට ඉහළ නැග ඇත.

## II (ඇ) 3 වෙනි සංඛ්‍යා සටහන

### 1969 සහ 1970 දී, සේවා ගිණුමේ ප්‍රධාන අංශ වල වූ වෙනස් වීම්

රුපියල් දශලක්ෂ

| | බැර | | | හර | | | ශේෂය | |
|---|---|---|---|---|---|---|---|---|
| | 1969 | 1970 | වෙනස | 1969 | 1970 | වෙනස | 1969 | 1970 |
| මූල්‍ය නොවන රන් .. | — | — | — | — | 2 | + 2 | — | − 2 |
| වරාය ප්‍රවාහණ සහ රක්ෂණ . | 128 | 110 | − 18 | 34 | 35 | + 1 | + 94 | + 75 |
| විදේශ සංචාර .. | 17 | 22 | + 5 | 22 | 20 | − 2 | − 5 | + 2 |
| ආයෝජන ආදායම් .. | 11 | 11 | — | 120 | 153 | +33 | − 109 | − 142 |
| (i) ලාභ සහ ලාභාංශ .. | 1 | 1 | — | 52 | 52 | — | − 51 | − 51 |
| (ii) පොළී .. | 10 | 10 | — | 68 | 101 | +33 | − 58 | − 91 |
| රජයේ වියදම් .. | 29 | 29 | — | 27 | 28 | + 1 | + 2 | + 1 |
| විවිධ සේවා .. | 69 | 66 | − 3 | 141 | 128 | − 13 | − 72 | − 62 |
| පෞද්ගලික සංක්‍රාම .. | 15 | 15 | — | 22 | 30 | + 8 | − 7 | − 15 |
| එකතුව .. | 269 | 253 | − 16 | 366 | 396 | +30 | − 97 | − 143 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

සේවා ගිණුමේ අසමතුලිතතාව තවත් පිරිහීමට බල පෑ ප්‍රධාන සාධක දෙකක් විය. පළමුවැන්න, ඉහත දී සඳහන් කළ පරිදි, වර්ගීකරණය පිළිබඳව සිදු කළ වෙනස්කම හේතුවෙන් වරාය ප්‍රවාහණ ශීර්ෂයේ එන ඉපයීම්වල සිදු වූ කෘත්‍රිම අඩුවීමය. දෙවැන්න හා වඩාත් වැදගත්ම කරුණ වනුයේ, රජයේ හා මූල්‍ය අධිකාරීන්ගේ වැඩිවන ණය බර හේතුවෙන් පොළී ගෙවීම්වල ඇති වූ කැපී පෙනෙන ඉහළ යාමය. 1968 දී රුපියල් දශ ලක්ෂ 43 ක් වූ පොළී ගෙවීම්, 1969 දී රුපියල් දශ ලක්ෂ 68 ක් බවට පත් වූ අතර, 1970 දී රුපියල් දශ ලක්ෂ 101 තෙක් ඉහළ ගොස් ඇත.

කෙසේ වෙතත්, විවිධ සේවා පිළිබඳ ගෙවීම්වල සුළු ඉහළ යාමක් දක්නට ඇත. එහි ඇතුළත් මූලික කොටස් වනුයේ, විදේශීය උපදේශක සේවා, කොමිස්, සහ විදේශයන්හි ප්‍රචාරක වියදම් ආදියයි.

සේවා ගිණුමේ ඇති එක්තරා දිරිගන්වන ලක්ෂණයක් වනුයේ, සංචාරක ඉපයීම් ඉහළ යාමය. වාසිදායක විනිමය අනුපාතයකින් ලද අනුබලය හා එලදායි ප්‍රචාරක වැඩ පිළිවෙල සමග එක් වූ, දේශීයව කර්මාන්තයේ ධාරිතාවය පුළුල්වීම ද මෙසේ සංචාරකයන්ගෙන් ඉපයීම්වල වර්ධනයකට මග පෑදූ බව පැහැදිලිය. තවද, ගෙවුම් ශේෂ සංඛ්‍යා ලේඛන රැස් කිරීමට පටන් ගත් ද සිටම, විදේශීය සංචාර ගිණුමෙහි අතිරික්තයක් පළමු වරට දැකිය හැකි අවස්ථාවද මෙය බව කිව යුතුය.

ප්‍රධාන වශයෙන් විදේශයන්හි සේවයේ යෙදෙන ලාංකිකයන් විසින් මෙරටට කරනු ලබන සංක්‍රාමවලින් සමන්විත පෞද්ගලික සංක්‍රාම, 1969 මට්ටමෙහිම පැවතීම දැකිය හැක.

### 3. ප්‍රාග්ධන ගිණුම

1970 දී, ජංගම ගිණුමේ යම්කිසි දියුණුවක් පෙනී ගියත්, ප්‍රාග්ධන ගිණුම ව්‍යුහයාත්මක දුර්වලකම් තවදුරටත් පෙන්නුම් කළේය. 1969 දී, රුපියල් දශ ලක්ෂ 1235 ක වර්තාගතවන මට්ටමකින් යුක්ත වූ විදේශීය සම්පත් පරතරය, 1970 දී සුළු වශයෙන් පහත බැසීමක් පෙන්වූ මුත්, එතකුදු එය රුපියල් දශ ලක්ෂ 1124 පමණ සාපෙක්ෂව ඉහළ මට්ටමකින් යුක්ත විය. ඒ පිළිබඳ විස්තර II (ඇ) 4 වෙනි සංඛ්‍යා සටහනෙහි දැක්වේ.

## II (උ) 4 වන සංඛ්‍යා සටහන

### විදේශීය සම්පත් පරතරය පියවීමට මුදල් ලබාගත් මාර්ග

### 1969 සහ 1970

| | 1969 | | 1970 | |
|---|---|---|---|---|
| | රු. දශලක්ෂ | ප්‍රතිශත කොටස | රු. දශලක්ෂ | ප්‍රතිශත කොටස |
| සම්පත් පරතරය .. | – 1,235 | | – 1124 | 100 |
| මුදල් ලැබීම .. | + 1,235 | 100 | + 1124 | – 2·3 |
| 1. විදේශ වත්කම් .. | 86 | 7·1 | – 26 | 10·9 |
| 2. විදේශ බැංකු වලින් ගැනීම් .. | 227 | 18·9 | 123 | 5·1 |
| 3. ජා. මූ. අ. කළ හැර ගැනීම් .. | 77 | 6·4 | 57 | – 6·7 |
| 4. ද්විපාර්ශ්වික වෙළඳ ශේෂ .. | 18 | 1·5 | – 75 | 38·6 |
| 5. කෙටි කාලීන වෙළඳ ණය .. | 185 | 15·4 | 434 | 7·5 |
| 6. සැපයුම්කරුවන්ගේ ණය .. | 176 | 14·7 | 85 | 23·4 |
| 7. ද්‍රව්‍යාධාර .. | 272 | 22·7 | 263 | 3·2 |
| 8. යෝජනාක්‍රම ආධාර .. | 89 | 7·4 | 36 | 6·7 |
| 9. පරිත්‍යාග .. | 46 | 3·8 | 75 | 0·9 |
| 10. පෞද්ගලික ප්‍රාග්ධනය .. | 9 | 0·8 | 10 | 4·7 |
| 11 සෙසු මාර්ග .. | 32 | 2·6 | 53 | 6·9 |
| 12. විශේෂ ගැනීමේ අයිතීන් .. | — | — | 78 | 1·0 |
| 13. වැරදීම් සහ අත්හැරීම් .. | 18 | 1·4 | 11 | |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

විදේශ සම්පත් සඳහා වූ අවශ්‍යතාවය ඉහළ වූයේ, විශාල ප්‍රමාණයක ප්‍රාග්ධනය ආපසු ගෙවීම සඳහා මුදල් සැපයිය යුතුවීම නිසාය. රජය සහ මහ බැංකුව විසින් ණය ක්‍රමක්ෂය කිරීම සඳහා දැරිය යුතු වූ ප්‍රමාණය සියයට 74 කින්, එනම්, 1969 පැවති රුපියල් දශ ලක්ෂ 361 සිට 1970 දී රුපියල් දශ ලක්ෂ 629 දක්වා ඉහළ යාමක් සිදු විය. මෙම ප්‍රමාණයෙන්, රුපියල් දශ ලක්ෂ 175 හෙවත්, සියයට 28 ක් පමණක්, රජයේ දිගු කාලීන ණය සම්මුතිවලින් සමන්විත විය. සෙසු මුලු මහත් රුපියල් දශ ලක්ෂ 454 ම, කෙටි කාලීන වගකීම් ක්‍රමක්ෂය කිරීම් වලින් යුක්ත විය.

1970 දී, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග කළ ගනුදෙනුවල කැපී පෙනෙන ලක්ෂණයක් වූයේ, ලංකාවේ වගකීම්වලින් විශාල ප්‍රමාණයක් මුදා හැරීමය. 1961 සිට, එනම් ලංකාව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ හැර ගැනීමේ පහසුකම් භාවිත කිරීමට පටන් ගත් තැන් සිට, 1969 දක්වා සෑම වර්ෂයකදීම අරමුදලෙන් කළ හැර ගැනීම්, එයින් කළ ප්‍රතිමිලදී ගැනීම්වලට වඩා වැඩි විය. 1969 දී රුපියල් දශලක්ෂ 9 ක ශුද්ධ ප්‍රතිමිලදී ගැනීමක් සිදුවූ අතර, 1970 දී, රුපියල් දශ ලක්ෂ 57 ක හැර ගැනීම් ඉදිරියේ රුපියල් දශ ලක්ෂ 161 ක ප්‍රතිමිලදී ගැනීම් සිදුකර ඇත. මෙය, 1970 දී ඉහළ මට්ටමක ප්‍රාග්ධන ගෙවීම් සඳහා මුදල් සැපයීමට හේතුවූ කරුණුවලින් එකක් විය.

1970 පැවති අන්දමේ සම්පත් පරතරයක් පියවා ගැනීමට, 1969 දී මෙන්ම, විදේශීය ණය ගැනීම් ඉහළ මට්ටමක තබා ගැනීමට සිදුවිය. දිගු කාලීන ණයවලින් කළ හැර ගැනීම් රුපියල් දශ ලක්ෂ 384 ක් වූ අතර, රජය සහ මහ බැංකුව මුහුණ පෑ කෙටි කාලීන ණය බර, රුපියල් දශ ලක්ෂ 667 ක් විය. දිගු කාලීන මුදල් සැපයීම් කලින් වසරට වඩා සියයට 29 කින් පහළ ගිය අතර, කෙටි කාලීන ණය විධිවිධාන වලින් කළ හැරගැනීම් සියයට 28 කින් ඉහළ ගියේය. කෙසේ වුවත්, මෙතරම් මට්ටමක ණය ගැනීම් වුවත්, මුලු සම්පත් පරතරය පියවීමට ප්‍රමාණවත් නොවූ බව පෙනී ගියේය. එබැවින්, විශේෂ ගැනීමේ අයිතීන් ලෙස හිමිකම් ඇති රුපියල් දශ ලක්ෂ 78 ක මුලු ප්‍රමාණයම යොදා ගැන්මටත්, රුපියල් දශලක්ෂ 75 ක් වූ නිල පරිත්‍යාග ලබා ගැන්මටත් සිදු විය. කෙසේ නමුදු, විදේශීය සංචිතයට, රුපියල් දශ ලක්ෂ 26 ක සුලු එකතුවක් සිදු කෙරුණ අතර, ගෙවීම් ගිවිසුම් පිළිබඳව ලංකාවේ වගකීම් ද රුපියල් දශ ලක්ෂ 75 කින් අඩු කෙරුණි.

1970 ගෙවුම් ශේෂ කටයුතු ගැන බලන විට, සම්පත් පරතරයේ ප්‍රමාණයටත් වඩා කුතුහලයට තුඩු දෙන්නේ, අසමතුලිතතාවයට මග පෑදූ අංශයන්හි සිදු වූ වෙනස්වීම්ය. මක්නිසාද යත්, ඉහත දී ඉහළ ප්‍රමාණයක විදේශීය සම්පත් යෙදවීමට අවශ්‍ය වූයේ ජංගම ගිණුමේ හිඟය පියවීමට හා සාමාන්‍ය තරමක විදේශීය ණය බරකින් මිදීමටය. එනමුත්, 1970 දී පැහැදිලිව පෙනෙන වෙනසක් වනුයේ, රුපියල් දශ ලක්ෂ 1124 ක් වූ සම්පත් පරතරයෙන් රුපියල් දශ ලක්ෂ 468 ක් එනම්, සියයට 41.6 ක් පමණක් ජංගම ගිණුමේ හිඟයෙන් සමන්විත විමය; ඉතිරිය වූ රුපියල් දශ ලක්ෂ 656, ප්‍රාග්ධන ගෙවීම් සඳහා වැය විය. නමුත් 1969 දී රුපියල් දශ ලක්ෂ 1235 ක පමණ විශාල සම්පත් පරතරයක් පවතිද්දී පවා, ප්‍රාග්ධන ගෙවීම් වෙනුවෙන් වැය වී ඇත්තේ ඉන් සියයට 31.7 ක් පමණක් වන අතර, ඉතිරි ප්‍රමාණය ජංගම ගිණුමේ හිඟය පියවීමට වැය විය.

අනිත් අතට ඉහළ මට්ටමක ප්‍රාග්ධන ගෙවීම්වලින් පිළිබිඹු වන්නේ, එක්දහස් නවසිය හැට ගණන්වල පසු භාගයෙහි කතිකා කරගත්, සාමාන්‍යයෙන් දිගු කාලීන ණයවලට ලැබෙන, ගෙවීම් සහනය පිළිබඳ කාලය දුන් අවසන් වී ඇති අතර, ඒවා ක්‍රමයෙන් ආපසු ගෙවීමට කාලය උද වී ඇති බවය. එමෙන්ම පසුගිය කාලයේ ජංගම ගිණුම පියවීමට යොදගත් ඉහළ ප්‍රමාණයක කෙටිකාලීන වගකීම්, ආපසු ගෙවීම සඳහා විදේශීය සම්පත්වලින් වැඩි ප්‍රමාණයක් යෙදීමට සිදුවී ඇති බවය.

**(ඇ) විදේශීය වත්කම්**

ලංකාවේ දළ විදේශ වත්කම්, 1970 දෙසැම්බර් මාසය අවසානයේදී රුපියල් දශ ලක්ෂ 402.6ක් ලෙස පැවතුණි. IIවන (පරිශිෂ්ඨයෙහි 47 වන සංඛ්‍යා සටහන බලන්න) රන් පවුම් ණය නිදන් අරමුදලට කළ දයක දීමනා ඉවත් කළ විට, ගෙවුම් ශේෂ හිඟයයන් සඳහා මුදල් සපයා ගැනීමට ඒවා ලබාගත නොහැකි නිසා, ශුද්ධ සංචිත ශක්තිය රුපියල් දශ ලක්ෂ 366.6 ක් විය.

සමස්ත විදේශීය වත්කම් අතුරෙන්, මහ බැංකුවේ ජාත්‍යන්තර සංචිතය 1969 දී පැවති රුපියල් දශලක්ෂ 194·0 මට්ටමට වඩා සියයට 28.8 කින් ඉහළ යාමක් පෙන්විය. රජයේ සහ රාජ නියෝජ්‍යත්වයන්හි හා ආයතනයන්හි විදේශ වත්කම් රුපියල් දශ ලක්ෂ 58.0 බවට පත්වූ අතර, එය පෙර වසරට වඩා රුපියල් දශ ලක්ෂ 15.5 කින් අඩුවීමක් වාර්තා කළේය වාණිජ බැංකු සංචිත රුපියල් දශ ලක්ෂ 12.2 කින් ඉහළ නගිමින්, රුපියල් දශ ලක්ෂ 150.6 බවට පත් විය. වාණිජ බැංකු ශේෂයන්හි ඇතුළත් වූ ප්‍රධාන කොටස සතු විදේශ විනිමය හා අපනයන බිල්පත්ය.

1970 දී විදේශීය සම්පත් පරතරය රුපියල් දශ ලක්ෂ 1124 ක් වුවත්, ලංකාවේ විදේශ වත්කම්, රන් පවුම් ණය නිදන් අරමුදල හැර ශුද්ධ වශයෙන්, රුපියල් දශ ලක්ෂ 39.1 කින් ඉහළ යාමක් දක්නට ලැබුණි. මේ අන්දමින් සංචිත ඉහළ යාමට හැකි වූයේ විදේශ ණයවලින් සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල දුන් විශේෂ ගැනීමේ අයිතීන්වලින් ලබාගත් හැර ගැනීම් නිසාය.

1970 සඳහා ලංකාවට හිමි වූ විශේෂ අයිතිය රුපියල් දශ ලක්ෂ 78 කි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග කළ ගනුදෙනු ඇතුළුව කෙටි කාලීන ශුද්ධ හැරගැනීම් රුපියල් දශ ලක්ෂ 19 කින් සමන්විත විය. විශේෂ ගැනීමේ අයිතීන් ප්‍රතිසම්පාදනය පිළිබඳව ඇති කොන්දේසි අනුව, රටට හිමි කොටසෙන් සියයට 30 ක සාමාන්‍ය ප්‍රමාණයක් ප්‍රයෝජනයට නොගෙන තිබිය යුතු වේ. විශේෂ හැර ගැනීමේ අයිතීන් ප්‍රතිපූරණයට අවශ්‍ය කොටස වූ රුපියල් දශ ලක්ෂ 23.4 සහ කෙටි කාලීන වගකීම්වල ඉහළ යාමට කොටසක් වෙන් කිරීමෙන් පසුව, විදේශ වත්කම් 1969 මට්ටමේ සිට සැබෑ වශයෙන් රුපියල් ලක්ෂ 3.3 කින් පහළ යා යුතුය.

### (ඇ) සංචාරක ව්‍යාපාරය

සංචාරක ව්‍යාපාරය ලංකාවට විදේශ විනිමය උපයා ගැනීමේ තරමක වැදගත් මාර්ගයක් බවට පත්ව ඇත. පැමිණෙන සංචාරකයින්ගේ[1] සංඛ්‍යාව වැඩිවීමත්, එහි ප්‍රතිඵලයක් වශයෙන් ඉපයෙන විදේශ විනිමය ප්‍රමාණය ඉහල යෑමත් තුළින් මෙම ව්‍යාපාරය තවදුරටත් පුළුල් කිරීමට ඇති ඉඩකඩ පෙන්නුම් කෙරේ. එහෙත් මෙම හැකියාවෙන් ඵල නෙලා ගැනීම සඳහා දැරූ ප්‍රයත්නයන් 1960 ගණන් වනතෙක්ම අසාර්ථක විය.

ලංකාවේ කුළුඳුල් සංචාරක ආයතනය 1937 තරම් ඈත දී පිහිටුවාලූ අතර, ප්‍රථම ලෝක සංග්‍රාමය පටන් ගැනීම හේතුකොට ගෙන එය ක්‍රියා විරහිත විය. නිදහස ලැබ නොබෝ කලකින්, එනම් 1948 දී නැවත වරක් සංචාරක ව්‍යාපාරය දියුණු කිරීම සඳහා සංචාරක ආයතනය පිහිටවනු ලැබීය. මෙම ආයතනය දීර්ඝ කාලයක් ක්‍රියාත්මක වුවද, එයින් ඇති වූ ප්‍රගතිය අල්ප විය. 1966 දී සංචාරක ආයතනය වෙනුවට ලංකා සංචාරක මණ්ඩලය පිහිටුවන ලද අතර, සංචාරක ව්‍යාපාරය වැඩි දියුණු කිරීම එයට පවරන ලදී.

1967 පමණ වන තෙක් ලංකාවට පැමිණි සංචාරකයින්ගේ සංඛ්‍යාව කේන්ද්‍රීය වශයෙන් වර්ෂයකට 19,000 ක් පමණ වූ අතර, සංචාරක ව්‍යාපාරයෙන් ලද විදේශ විනිමය ඉපයුම් ප්‍රමාණය ස්ථාවරව පැවතුණි. මෙයට ප්‍රධාන හේතුව වූයේ සංචාරක ව්‍යාපාරය දියුණු කිරීම සඳහා පුළුල්ව සිතා බලා සකස් වූ සැලැස්මක් අනුව කටයුතු නොකිරීමය. 1967 දී පැමිණි සංචාරිකයින්ගේ සංඛ්‍යාව 23,666 ක් වූයෙන්, 1966 වර්ෂය හා සසඳන විට සියයට 24·5 ක වැඩිවීමක් සටහන් විය. එතැන් සිට ලංකාවට මෙහෙයවුණු සංචාරක ආගමනය, ස්ථාවර ඉහළ නැමියාවක් පෙන්නුම් කරමින්, 1967 දී 23,666 සිට 1969 දී 40,204 දක්වා ඉහළ ගියේය. සංචාරක ව්‍යාපාරයෙන් ලද විදේශ විනිමය ඉපයුම් ද 1967 දී එ. ජ. ඩොලර් දශලක්ෂ 1·2 සිට 1969 දී එ. ජ. ඩොලර් දශලක්ෂ 2·86 දක්වා ඉහළ නැග ඇත.

**II (උ) 5 වෙනි සංඛ්‍යා සටහන**

**සංචාරක ආගමනයේ නැමියාව**

| වර්ෂය | පැමිණියවුන්ගේ සංඛ්‍යාව | පැමිණියවුන්ගේ සංඛ්‍යාව ඉන්දියානුන් හැර | පැමිණියවුන්ගේ දර්ශකය ඉන්දියානුන් හැර (1961=100) |
|---|---|---|---|
| 1961 | 27,777 | 17,724 | 100·0 |
| 1962 | 26,397 | 16,106 | 90·9 |
| 1963 | 18,440 | 15,103 | 85·2 |
| 1964 | 18,872 | 16,002 | 90·3 |
| 1965 | 19,781 | 15,118 | 85·3 |
| 1966 | 18,969 | 15,325 | 86·5 |
| 1967 | 23,666 | 19,043 | 107·4 |
| 1968 | 28,272 | 21,469 | 121·1 |
| 1969 | 40,204 | 31,363 | 176 9 |
| 1970 | 46,247 | 35,561 | 200·6 |

මූලය : ලංකා සංචාරක මණ්ඩලය.

1967 සිට ලංකාවට පැමිණි සංචාරකයින්ගේ වැඩිවීමට ප්‍රධාන හේතු සාධක ලෙස දැක්විය හැක්කේ ලංකා සංචාරක මණ්ඩලය විසින් ගනු ලැබූ ප්‍රචාරක හා සංවිධානාත්මක ප්‍රයත්නයන් සහ මෙම කර්මාන්තයෙහි කරන ලද ආයෝජනයයි.

### 1970 දී සංචාරක ව්‍යාපාරය

1970 වර්ෂය තුළදී ලංකාවට පැමිණි සංචාරකයින්ගේ සංඛ්‍යාව 46,247 ක් වූ අතර, එය ඉකුත් වර්ෂයට වඩා 4043 ක නැතහොත් සියයට 15 ක වැඩිවීමක් පෙන්නුම් කරයි. එහෙත් එය, වර්ෂය තුළදී පැමිණේ යයි ඇස්තමේන්තු කරන ලද සංඛ්‍යාව වූ 51,000 ට වඩා 5,000 කින් අඩුවීමකි. සංචාරකයින්ගේ ආගමනය මෙලෙස අඩු මට්ටමකින් ප්‍රසාරණය වීමට හේතු වූයේ වර්ෂයේ දෙවන භාගයේදී පැමිණීම අඩු වීමය. එසේ වුවද, සංචාරක ව්‍යාපාරයෙන් 1970 දී උපයන ලද විදේශ විනිමය ප්‍රමාණය රුපියල් දශලක්ෂ 21·5 ක් (එ·ජ·ඩොලර් දශලක්ෂ 3·6 ක්) වූයෙන්, 1969 වර්ෂය හා සසඳන විට රුපියල් දශලක්ෂ 4·5 ක නැතහොත් සියයට 26·5 ක වැඩිවීමක් පෙන්නුම් කරයි. මේ අනුව, 1970 දී සංචාරකයින්ගේ පැමිණීම වැඩි වූ අනුපාතයට වඩා ඉහළ අනුපාතයකින්, විදේශ විනිමය ඉපයීම් ප්‍රසාරණය වී ඇත. සංචාරක ව්‍යාපාරයෙන් ලද විදේශ විනිමය ඉපැයීම් 1970 දී මුළු අපනයන ඉපයීම්වලින් සියයට එකක් පමණි.

1· සංචාරකයින් යනුවෙන් හැඳින්වෙනුයේ එක් රැයක් හෝ ඊට වැඩි කලක් මෙහි ගත කළ විදේශීය අමුත්තන්ය.

## II (උ) 6 වෙනි සංඛ්‍යා සටහන

### සංචාරක ව්‍යාපාරයෙන් ලද විදේශ විනිමය ඉපයුම්

| වර්ෂය | මුළු ඉපැයුම (රුපියල් දහස්) | මුළු ඉපැයුම (එ.ජ. ඩොලර් දහස් ගණනින්) | ඉකුත් වර්ෂය හා සසඳන විට % වැඩිවීම/අඩුවීම | දර්ශකය (1961=100) |
|---|---|---|---|---|
| 1961 | 7,761 | 1,609 | — | 100·0 |
| 1962 | 5,265 | 1,106 | − 31·3 | 68·7 |
| 1963 | 5,532 | 1,162 | + 5·1 | 72·2 |
| 1964 | 5,462 | 1,147 | − 1·3 | 71·3 |
| 1965 | 6,049 | 1,271 | + 10·8 | 79·0 |
| 1966 | 6,116 | 1,285 | + 1·1 | 79·9 |
| 1967 | 5,859 | 1,211 | − 5·7 | 75·3 |
| 1968 | 10,533 | 1,770 | + 46·2 | 110·0 |
| 1969 | 17,032 | 2,862 | + 61·7 | 177·9 |
| 1970 | 21,503 | 3,614 | + 26·3 | 224·6 |

මූලය: ලංකා සංචාරක මණ්ඩලය.

1970 දී ලංකාවට ඇදී හා සංචාරකයින්ගෙන් සියයට 49·5 ක් බටහිර යුරෝපයෙන්ද, සියයට 32·2 ක් ආසියාවෙන්ද, සියයට 12·6 ක් උතුරු ඇමෙරිකාවෙන්ද, සියයට 3·0 ක් ඕස්ට්‍රේලියාවෙන් ද පැමිණ ඇත.

## II (උ) 7 වෙනි සංඛ්‍යා සටහන

### ප්‍රධාන වෙළඳපොල වලින් ලංකාවට ඇදී ආ සංචාරික වර්ධනය

| රට | පැමිණියවුන්ගේ සංඛ්‍යාව | | | සාමාන්‍ය වාර්ෂික වර්ධන අනුපාතය |
|---|---|---|---|---|
| | 1966 | 1969 | 1970 | 1966 සිට 1969 දක්වා (%) |
| ඇ. එ. ජ. .. | 2,978 | 5,264 | 5,155 | 20·9 |
| එ. රා. .. | 3,670 | 5,445 | 5,484 | 14·1 |
| බටහිර ජර්මනිය .. | 1,250 | 4,143 | 5,771 | 49·0 |
| ප්‍රංසය .. | 1,164 | 3,220 | 4,480 | 40·4 |
| ස්කැන්ඩිනේවියාව . | 378 | 2,532 | 2,363 | 88·5 |
| ස්විට්සර්ලන්තය .. | 597 | 1,657 | 2,117 | 40·6 |
| ඉතාලිය .. | 376 | 1,072 | 1,054 | 41·8 |
| ඉන්දියාව .. | 3,644 | 8,841 | 10,686 | 34·4 |
| මලයාසියාව .. | 718 | 1,077 | 1,388 | 14·5 |
| ජපානය .. | 619 | 1,090 | 1,042 | 20·8 |
| ඕස්ට්‍රේලියාව .. | 756 | 1,003 | 1,193 | 9·8 |

මූලය: ලංකා සංචාරක මණ්ඩලය

සංචාරකයින්ගේ ආගමනය පැමිණි අරමුණ අනුව විශ්ලේෂණය කළ කල්හි, පැමිණි මුළු සංඛ්‍යාවෙන් සියයට 77 ක් හුදු සංතුෂ්ටිය එනම්, විවේකය විනෝදය සහ දේශාටනය සඳහාද, සියයට 8.7 ක් ව්‍යාපාරික කටයුතු සඳහාද, ඉතිරි සියයට 14.2 ආගමික සංස්කෘතික, සහ මිතුරන් හා ඥාතීන් හමුවීම ආදී වෙනත් කටයුතු සඳහාද පැමිණි බැව් පෙනේ සංචාරකයින්ගේ ආගමනය 1970 දී සියයට 15 කින් වැඩි වීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ විනෝදය පිණිස පැමිණියවුන්ගේ සංඛ්‍යාව ඉහළ යාමය. විනෝදය පිණිස පැමිණි සංචාරකයින්ගේ සංඛ්‍යාව 1969 දී 30,207 සිට 1970 දී 25,627 දක්වා 5,420 කින් නැතහොත් සියයට 18 කින් වැඩි විය. වෙනත් ගණයට අයත්වන සංචාරකයින්ගේ සංඛ්‍යාව 2,144 කින් නැතහොත් සියයට 48 කින් ඉහළ ගිය අතර, ව්‍යාපාරික කටයුතු සඳහා පැමිණියවුන්ගේ සංඛ්‍යාවෙහි අඩුවීමක් දැක්වෙයි.

1970 දී පැමිණි සංචාරකයින්, රාත්‍රී 470,000 ක් ලංකාවේ ගතකොට ඇතැයි ඇස්තමේන්තු කර තිබේ. මේ වූ කලී, 1969 හා සසඳන විට සියයට 16 ක වැඩිවීමකි. වර්ගකරණ ලද පොදු නවාතැන්වල සාමාන්‍ය ලැගුම් ගැනීමේ අනුපාතය 1970 දී සියයට 48·8 ක්වූ අතර, එය 1969 අනුපාතයට වඩා සියයට 1·5 කින් අඩුවී ඇත. මෙයට තරමක් දුරට හේතු වූයේ නවාතැන්වල ඉඩකඩ 1969 දී කාමර 1125 ක්ව තිබී 1970 දී එය 1600 දක්වා, එනම් කාමර 475 කින් වැඩි වීමය.

## (අ) සංඛ්‍යා සටහන*

### 1969 - 1970

රුපියල්

| | 1969 | | |
|---|---|---|---|
| | හර | බැර | ශුද්ධ |
| **1. වෙළඳ ගිණුම** | | | |
| අපනයන (නැ·වි·ස·) .. .. .. | 1,909 | | |
| ආනයන (මි·ර·ගැ·) (ස්ව සම්පත්) .. .. | | 2,074 | |
| (ආධාර ආනයන සහ සැපයුම් කරුවන්ගේ ණය) .. | | 581 | |
| මුළු ආනයන .. .. .. | | 2,655 | |
| වෙළඳ ශේෂය (ස්ව සම්පත්) .. .. | | | (– 165) |
| වෙළඳ ශේෂය (සියලුම ආනයන) .. .. | | | – 746 |
| **2. සේවා ගිණුම** | | | |
| මූල්‍ය නොවන රන් .. .. | — | — | — |
| වරාය, ප්‍රවාහණ සහ රක්ෂණ .. .. | 128 | 34 | + 94 |
| විදේශ සංචාර .. .. | 17 | 22 | – 5 |
| ආයෝජන ආදයම් .. .. | 11 | 120 | – 109 |
| (i) ලාභ සහ ලාභාංශ .. .. | 1 | 52 | – 51 |
| (ii) අනෙකුත් (පොලී) .. .. | 10 | 68 | – 58 |
| රජයේ වියදම් .. .. | 29 | 27 | + 2 |
| විවිධ සේවා .. .. | 69 | 141 | – 72 |
| පෞද්ගලික සංක්‍රාම .. .. | 15 | 22 | – 7 |
| මුළු සේවා .. .. | 269 | 366 | – 97 |
| **3. මුළු ජංගම ගිණුම (ස්ව සම්පත්)** .. .. | (2,178) | (2,440) | (– 262) |
| මුළු ජංගම ගිණුම (සියළුම ගිණුම) .. .. | 2,178 | 3,021 | – 843 |
| **4. ප්‍රාග්ධන ගෙවීම්** .. .. | — | 392 | – 392 |
| ණය .. .. | — | 77 | – 77 |
| සැපයුම්කරුවන්ගේ ණය .. .. | — | 50 | – 50 |
| කෙටිකාලීන ණය .. .. | — | 147 | – 147 |
| තෙල් වන්දි සහ ආසියානු සංවර්ධන බැංකුව .. .. | — | 12 | – 12 |
| පෞද්ගලික ප්‍රාග්ධනය .. .. | — | 10 | – 10 |
| ජාත්‍යන්තර මූල්‍ය අරමුදල .. .. | — | 87 | – 87 |
| බැංකු ණය .. .. | — | — | — |
| අනෙකුත් .. .. | — | 9 | – 9 |
| මුළු ජංගම හා ප්‍රාග්ධන ගෙවීම් (ස්ව සම්පත්) .. .. | | | – (654) |
| මුළු ජංගම හා ප්‍රාග්ධන ගෙවීම් (සියලුම ගිණුම්) .. | | | –1,235 |
| **5. මුදල් සැපයීම** .. .. | | | |
| ජා. මූ. අ. හැර ගැනීම් .. .. | 77 | — | + 77 |
| බැංකු ණය .. .. | 227 | — | + 227 |
| ද්විපාර්ශ්වික ශේෂ .. .. | 18 | — | + 18 |
| සැපයුම්කරුවන්ගේ ණය .. .. | 176 | — | + 176 |
| කෙටි කාලීන ණය .. .. | 185 | — | + 185 |
| විදේශ වත්කම් .. .. | 86 | — | + 86 |
| ද්‍රව්‍යාධාර .. .. | 272 | — | + 272 |
| යෝජනාක්‍රම හා වෙනත් ආධාර .. .. | 89 | — | + 89 |
| පරිත්‍යාග .. .. | 46 | — | + 46 |
| පෞද්ගලික ප්‍රාග්ධනය .. .. | 9 | — | + 9 |
| අනෙකුත් .. .. | 32 | — | + 32 |
| විශේෂ හැර ගැනීමේ අයිතීන් .. .. | — | — | — |
| වැරදීම් හා අත්හැරීම් .. .. | 18 | — | + 18 |
| මුළු මුදල් සැපයීම .. .. | 1,235 | — | +1,235 |

* තාවකාලිකයි.

**ගෙවුම් ශේෂය**

| දශ ලක්ෂ | | | එ. ජ. ඩොලර් දශ ලක්ෂ | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 1970* | | | 1969 | | | 1970* | | |
| හර | බැර | ශුද්ධ | හර | බැර | ශුද්ධ | හර | බැර | ශුද්ධ |
| 2,011 | | | 321 | | | 338 | | |
| | 1,867 | | | 348 | | | 314 | |
| | 469 | | | 98 | | | 78 | |
| | 2,336 | | | 446 | | | 392 | |
| | | (+ 144) | | | (− 27) | | | (+ 24) |
| | | − 325 | | | −125 | | | − 54 |
| — | 42 | − 2 | — | — | — | — | — | — |
| 110 | 35 | + 75 | 21 | 6 | + 15 | 18 | 6 | + 12 |
| 22 | 20 | + 2 | 3 | 4 | − 1 | 4 | 3 | + 1 |
| 11 | 153 | − 142 | 2 | 20 | − 18 | 2 | 26 | − 26 |
| 1 | 52 | − 51 | — | 9 | − 9 | — | 9 | − 9 |
| 10 | 101 | − 91 | 2 | 11 | − 9 | 2 | 17 | − 17 |
| 29 | 28 | + 1 | 5 | 4 | + 1 | 5 | 5 | — |
| 66 | 128 | − 62 | 12 | 24 | − 12 | 11 | 22 | − 11 |
| 15 | 30 | − 15 | 2 | 4 | − 2 | 3 | 5 | − 2 |
| 253 | 396 | − 143 | 45 | 61 | − 16 | 43 | 67 | − 25 |
| (2,264) | (2,263) | (+ 1) | (366) | (409) | (− 43) | (381) | (381) | (− 8) |
| 2,264 | 2,732 | − 468 | 366 | 507 | − 141 | 381 | 459 | − 92 |
| — | 656 | − 656 | — | 66 | − 66 | — | 110 | − 97 |
| — | 113 | − 113 | — | 13 | − 13 | — | 19 | − 19 |
| — | 62 | − 62 | — | 8 | − 8 | — | 10 | − 10 |
| — | 293 | − 293 | — | 25 | − 25 | — | 49 | − 49 |
| — | 4 | − 4 | — | 2 | − 2 | — | 1 | − 1 |
| — | 12 | − 12 | — | 2 | − 2 | — | 2 | − 2 |
| — | 161 | − 161 | — | 15 | − 15 | — | 27 | − 27 |
| — | — | — | — | — | — | — | — | — |
| — | 11 | − 11 | — | 2 | − 2 | — | 2 | − 2 |
| | | (− 655) | | | (−109) | | | (−110) |
| | | −1,124 | | | −207 | | | −189 |
| 57 | — | + 57 | 13 | — | + 13 | 9 | — | + 9 |
| 123 | — | + 123 | 38 | — | + 38 | 21 | — | + 21 |
| — | 75 | − 75 | 3 | — | + 3 | — | 13 | − 13 |
| 85 | — | + 85 | 30 | — | + 30 | 14 | — | + 14 |
| 434 | — | + 434 | 31 | — | + 31 | 73 | — | + 73 |
| — | 26 | − 26 | 14 | — | + 14 | — | 4 | − 4 |
| 263 | — | + 263 | 46 | — | + 46 | 44 | — | + 44 |
| 36 | — | + 36 | 15 | — | + 15 | 6 | — | + 6 |
| 75 | — | + 75 | 8 | — | + 8 | 13 | — | + 13 |
| 10 | — | + 10 | 2 | — | + 2 | 2 | — | + 2 |
| 53 | — | + 53 | 5 | — | + 5 | 9 | — | + 9 |
| 78 | — | + 78 | — | — | — | 13 | — | + 13 |
| 11 | — | + 11 | 3 | — | + 3 | 2 | — | + 2 |
| 1,225 | 101 | +1,124 | 207 | — | +207 | 206 | 17 | +189 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## සංඛ්‍යා සටහන (ආ)

## විදේශීය මුදල් මාර්ග සහ ඒවා යෙදවූ අයුරු

| ශීර්ෂ | රුපියල් දශ ලක්ෂ | | | | ප්‍රතිශත කොටස | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 1967 | 1968 | 1969 | 1970 | 1967 | 1968 | 1959 | 1970 |
| අ. සම්පත් | | | | | | | | |
| 1. වෙළඳ භාණ්ඩ අපනයන (නැ.වි.ස.) | 1,650 | 1,976 | 1,909 | 2,011 | 70 | 68 | 56 | 58 |
| 2. සේවා ගිණුම් .. | 216 | 255 | 269 | 253 | 8 | 9 | 8 | 7 |
| 3. ප්‍රාග්ධන ලැබීම් .. | 261 | 326 | 417 | 384 | 11 | 11 | 12 | 11 |
| (අ) ණය[1] .. | 212 | 295 | 362 | 299 | 9 | 10 | 11 | 9 |
| (ආ) පරිත්‍යාග[1] .. | 46 | 23 | 46 | 75 | 2 | 1 | 1 | 2 |
| (ඇ) පෞද්ගලික ප්‍රාග්ධන .. | 3 | 3 | 9 | 10 | — | — | — | — |
| 4. කෙටිකාලීන වගකීම් .. | 275 | 348 | 715 | 830 | 11 | 12 | 21 | 24 |
| (අ) ජා. මු. අ. හැර ගැනීම් (දළ) .. | 123 | 213 | 77 | 57 | 5 | 7 | 2 | 2 |
| (ආ) විශේෂ හැර ගැනීමේ අයිතීන් .. | — | — | — | 78 | — | — | — | 2 |
| (ඇ) ද්විපාර්ශ්වික ගෙවුම් සම්මුති ශේෂවල වැඩිවීම් .. | 80 | 42 | 18 | — | 3 | 2 | 1 | — |
| (ඇ) විදේශ බැංකු වලින් ගැනීම් .. | 57 | — | 227 | 123 | 2 | — | 7 | 4 |
| (ඉ) කෙටිකාලීන ණය .. | — | 84 | 185 | 434 | — | 3 | 5 | 12 |
| (ඊ) සැපයුම්කරුවන්ගේ ණය .. | — | — | 176 | 85 | — | — | 5 | 2 |
| (උ) වෙනත් .. | 15 | 9 | 32 | 53 | 1 | — | 1 | 1 |
| 5. (රන් පවුම් නිදන් ණය අරමුදල් හැර) විදේශ වත්කම් අඩුවීම් .. | — | — | 90 | — | — | — | 3 | — |
| **එකතුව** .. | **2,402** | **2,905** | **3,399** | **3,478** | **100** | **100** | **100** | **100** |
| ආ. යෙදවූ අයුරු | | | | | | | | |
| 6. වෙළඳ භාණ්ඩ ආනයන මි.ර.ගැ. .. | 1,985 | 2,356 | 2,655 | 2,336 | 83 | 81 | 78 | 67 |
| ඒවායින් – ආධාර .. | 258 | 323 | 581 | 469 | 11 | 11 | 17 | 13 |
| 7. සේවා ගිණුම් .. | 216 | 258 | 366 | 396 | 9 | 9 | 11 | 11 |
| (අ) ආයෝජන ආදයම .. | 32 | 24 | 120 | 153 | 1 | 1 | 4 | 4 |
| (ආ) සංක්‍රමණික සංක්‍රාම .. | 31 | 21 | 15 | 30 | 1 | 1 | 1 | 1 |
| (ඇ) පොලී ගෙවීම් .. | 33 | 42 | 10 | 101 | 1 | 1 | 2 | 3 |
| 8. ප්‍රාග්ධන ගෙවීම් හා පිටරට යැවීම් .. | 73 | 251 | 392 | 656 | 3 | 9 | 11 | 19 |
| (අ) පෞද්ගලික .. | 10 | 15 | 10 | 12 | — | 1 | 1 | — |
| (ආ) නිල .. | 45 | 61 | 77 | 113 | 2 | 2 | 2 | 3 |
| (ඇ) ජා.මු.අ. ප්‍රතිමිලට ගැනීම් සහ රන් දයක දීමනා .. | 18 | 48 | 87 | 161 | 1 | 2 | 3 | 5 |
| 9. සැපයුම්කරුවන්ගේ ණය .. | — | — | 50 | 62 | — | — | 1 | 2 |
| 10. කෙටිකාලීන ණය .. | — | 98 | 147 | 293 | — | 3 | 4 | 8 |
| 11. බැංකු ණය ගෙවීම් .. | — | 29 | — | — | — | 1 | — | — |
| 12. වෙනත් .. | — | — | 21 | 15 | — | — | 1 | — |
| 13. කෙටිකල් වගකීම්[2] .. | — | 7 | — | 75 | — | — | 1 | 2 |
| 14. (රන් පවුම් නිදන් ණය අරමුදල් හැර) විදේශ වත්කම් වැඩිවීම් .. | 125 | 10 | — | 39 | 5 | — | — | 1 |
| 15. සමතුලිත ශීර්ෂය .. | + 3 | + 23 | – 14 | – 8 | — | 1 | — | — |
| **එකතුව** .. | **2,402** | **2,905** | **3,399** | **3,478** | **100** | **100** | **100** | **100** |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

1. යෝජනාක්‍රම ආධාර සහ ද්‍රව්‍යාධාරවල ස්වරූපයෙන් ලැබුණු ආධාර ඇතුලත්වේ.

2. කෙටිකාලීන වගකීම් ද්විපාර්ශ්වීය ගෙවීම් ගිවිසුමේ ශේෂ යන්හි වෙනස්වීම් සහ විශේෂ ගිණුම් පහසුකම් භුක්ති විඳින ව්‍යාපාරික ආයතනයන්ගේ ශේෂයන්හි වෙනසින් සමන්විතයි.